දැල කොටු කරමු

මිනිස්සු ජීවත් කරවන්නේ ඉලාපොරොත්තුනෙ. ඒවා ඉටු කරගන්න දීන ගැන ගැන තමයි අපේ ජීවිත ගතවෙන්නෙ. මෙතෙක් කල් හුරු වෙලා හිටිය පුද්ගලික බලාපොරොත්තු වෙනුවට දැන් සමස්ථ සමාජයට එකම බලාපොරොත්තුවකින් ජීවත් වෙන්න කාලයක් ඇවිල්ලා මේ යහ පාලනයත් එක්ක. ඒකට දින සීයයි. දැන් දින 24ක් විතර ගෙවිලා. දින වලට සෙට් කරලා තිබුණ වැඩ

සටහනක් එහෙට මෙහෙට වෙනකොට සමාජයම අවුල් වෙනවා. ආර්ථික සහන කිව්ව විදිහට දුන්න වුණත් මිනිසුන්ගේ එකම අරමුණ කන බොන දේ නෙවෙයි. යහ පාලනයක් ඇති කර ගැනීම සඳහා මූලික වුණ ප්‍රධාන කොන්දේසි ටික ඉටු කර ගැනීම. ඒක ටිකක් මන්දගාමී වෙනකොට මිනිස්සු චාංචක් වෙලා. වචන දෙකක් හදාගෙන එකිනෙකා අමතන්න පටන් අරන්. දැන් ඕනෙ දේකට " කොහොමද යහ පාලනේ?" කියලා අහනවා.

අපේ මිනිස්සුන්ට කොහොමත් ඉවසීම මදි වුණත් ගොනා හැරෙන්නේ පැලේ කන්න කියලත් මිනිස්සුන්ට දැනුමක් තියෙනවා. අපේ රටේ මිනිස්සු පළමු වතාවට බඩ ගැන නොහිතා දුන්න ඡන්දයට අවමන් කරන්න චූටි මල්ලිත් කැමති නැහැ. ඒත් මේ මිනිස්සු ගැන තමඕක විශ්වාසයක් නැහැ. වැඩේ ඉවර වෙනකල් ඒ ගැන සෘණතාමකව හිතන්න කැමතිත් නැහැ. මතුපිටින් බලලා ලබපු ජයත් එක්ක අපි හිතන හැම්දේම ඉටු කරගන්න හදන මිනිස්සු ඉච්ඡාභංගත්වයට පත්වෙලා කියන කරන දේ ගැන නම් මාර දුකයි. මිනිස්සු මේ ගොඩනැගලා තියෙන්නෙ මේ ලෝකෙ කොහේවත් නැති ආණ්ඩුවක් කියලාවත් මේකෙ ආණ්ඩුවත් විපක්ෂයත් දෙකම එකයි කියලවත් මිනිස්සු හරි හැටි තේරුම් අරන් ඇති බවක් පේන්නත් නැහැ. දින සීයක් දීලා ආණ්ඩුවක් පිහිටුවාගත්තට ඒ ආණ්ඩුව සර්ව නිර්දෝෂී සුපිරිසිදු ආණ්ඩුවක් ය උන් හොරකමට වංචාවට දඬුවම් දෙන්නේ නැත්තේ ඇයි ය කියලා මරහඬ දෙන්න කලින් මොළේ කල්පනා කරලා ඡන්දය දුන්නා වගේම හිතල බලමු මිත්‍රවරුනි. මේ පත්වෙලා ඉන්නෙත් හුඟාක් හොඳ මහත්වරුම නෙවෙයි. මේ ගොල්ලන්ගේත් හුඟ දෙනෙකුගේ අතීතය ඒ තරම් සුදු නැහැ. ඉඩක් ලැබුණොත් ඒ ගොල්ලොත් පනින්නෙ කැලේම තමයි. වාසනාවට මේ පාර හොඳ සෙට් එකකුත් මේ ගොල්ලන්ගේ වටේට දැලක් දාගෙන ඉන්නෙ. කාටවත් දඟලන්න බැරි වේවි. ඒ නිසා අපි සේරම එකතුවෙලා මේ දැල කොටු කරමු. අපට තවත් දවස් 76 ක් තියෙනවා. මේක අමුතුම පොලිටිකල් ගේම් එකක්. චූටි මල්ලි නම් වැඩේට සප් එකක් දුන්නට හිටු කියලා එකසිය ගානට වැඩේට කඩේ ගියේ නැති නිසා ඉවසීමත් දරාගෙන ඉන්නම්. කට්ටියත් එහෙම ඉමු කියලා තමයි මං කියන්නෙ. මොකද වෙන්නේ කියලා බලලා අප්‍රේල් මාසේ මේ මොලෙන්ම හොඳ වැඩක් කරලා හොඳ ඔලු ටිකකට වැඩේ බාර දෙමු.

අරමුණු සහ අහිංසක ජීවිත

අයිසීස් සංවිධානයෙන් ජපන් ජාතික මාධ්‍යවේදියකුව තිරශ්චීන විදිහට මරන හැටි දැක්කම ඔබට ඇතුවන්නෙ කුමන හැඟීමක්ද? තමන්ගේ අරමුණු ඉටු කර ගැනීම සඳහා කිසිම විදිහකින් තමන්ගේ අරමුණට එරෙහිව නොගිය අහිංසක මිනිසුන් අමු අමුවේ මරා දැමීම අපි විග්‍රහ කර ගත යුත්තේ කුමන පදනමකින්ද කියන එක නම් මාර ප්‍රශ්නයක්.

අරමුණු ඉටු කර ගැනීම් වලදී ඉතිහාසය පුරාම මිනිසුන් ඝාතනයට ලක් වී තිබෙනවා. එහෙත් මේක ඝාතන වල නව අවදියක්. චූටි මල්ලි මේ විදිහේ ඝාතන වලට කොහොමත් විරුද්ධයි. අරාබියේ කරන ප්‍රසිද්ධ හිස ගසා දැමීම් වලත් මෙයිට වඩා සදාචාරයක් තියෙනවා කියලයි මට නම් හිතෙන්නෙ.

මේ ආකාරයේ ඝාතන වලට ටිකක් සමීප අතීතයක් අපේ රටෙත් තිබුණ නිසා මගේ මිත්‍රයෙක් එක්ක මං පොඩි වාදයක පැටලුණා. අරමුණු ඉටු කර ගැනීමේදී විවිධ උපක්‍රම භාවිතා කරන්නට සිදුවීමත් මෙය එහි පෙරට යාමක් ලෙසත් ඔහු තර්ක කළා. ඔහු තව දුරටත් කිව්වෙ ඒ අරමුණු කිනම් ඒවාද යන කාරණය මත ක්‍රියාවේ සාධාරණ අසාධාරණ බව තීරණය වන බවයි. ඔහු වසර 20 කට ඉහත ලංකාවේ සිදුවීම් විග්‍රහ කළේ ඒවා සමාජ පරිවර්තනය සඳහා වූ උදාර අරමුණු උදෙසා සටන් ක්‍රියාමාර්ග ගැනීමේදී සිදුවූ අහුඹු සිදුවීම් ලෙසයි. මගේ තර්කය වුණේ එසේ නම් අයිසීස් සංවිධානයත් සටන් කරන්නේ ඔවුන්ගේ ජනතාව උදෙසා ඔවුන්ගේම රටක් නිර්තනය කරගැනීම සඳහා නිසා

ඔවුන්ගේ මේ ක්‍රියාමාර්ගත් සාධාරණීකරණය කළ හැකි නොවේද කියලයි. අපි බොහෝ තර්ක විතර්ක කළා. අවසානයේ මගේ හිතවතා පිළිගත්තා මේ මිහීමරුම් සාධාරණීකරණය කරන්න බැරි බව. සටන් ක්‍රියා මාර්ග වලට අනුගත වූ පසු මිනිසුන් නිතැතින්ම මිලේච්ඡත්වයට පත්වෙනවා. මට හිතෙන්නේ අරමුණු ඉටු කර ගැනීම් වලදී මිනිස්සු මැරෙන්න ඕනේ සටනකදී මීසක් මේ වගේ මලෙච්ඡ විදිහට නොවෙයි කියලයි.

අපට චණ්ඩි එපා

විදේශීය රාජ්‍ය දූත සේවය කියන්නෙ දැං කාලේ මේ තරම් සිම්පල් තත්වෙට වැටුණට ඉතාම වගකීම් සහිත වෘත්තියක්. අහල තියෙන විදිහට නම් ඒ තනතුරු වලට ඉහළ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද අත්‍යවශ්‍ය කාරණයක්ලු. මාධ්‍ය වලින් දැනගන්න තියෙන විදිහට දැං මේවායේ අරක් ගෙන ඉන්න හාදයෝ නිසා දූත සේවය අපූත වෙලා. මේ රාජ්‍ය දූත සේවය කෙතරම්

බලසම්බන්නද යන්නත් රටක් ජනතාවක් සංස්කෘතියක් තුළට කොපමණ බලපෑමක් කළ හැකිද යන්නත් ගැන හොඳ පොත් ලියැවිලා තියෙනවා.

1958 අවුරුද්දෙ "අවලස්සන ඇමරිකානුවා" පොතේ (මාර්ග ප්‍රකාශනයක් විදිහට 1975 මුලින් පිටවුණේ) ඉන්දු චීන හිමිනයේ ජනතාවගේ සිතුම් පැතුම් වලට ඇමරිකානු රාජ්‍ය දූත සේවය කළ බලපෑම් ගැන විස්තර වෙනවා. ඉන්න චණ්ඩින්ට කියවන්න දෙන්නම ඕනෙ පොතක්. මං ඉතින් මේක ගැන ලියන්න හිතුවෙ මේ දවස් වල අපේ රටේ දූත සේවයේ වෙමින් තිබෙන වෙනස් කම් නිසාත් අපට බලපාන ඕස්ට්‍රේලියාව තුළ දැන් මතුවෙමින් තිබෙන තත්වයත් ඊට සමානව පැතිරෙණ දූෂමාන ආරංචිත් නිසා. හුඟක් දෙනා බොහෝ කරුණු කාරණා මාධ්‍ය හරහා දන්න නිසා වැඩි කතා ඕනේ නැහැනේ. අපට චණ්ඩි ඕනෙ නැහැ. චණ්ඩින්ට පිටිපස්සෙන් හැංගිලා ඉන්න මෙල්බන් වල වයසක චණ්ඩි ඕනෙත් නැහැ.

දූත මණ්ඩල කාර්යාල වලට ඕනේ හොඳ දූතයෝ. යුවන්පියේ ඉඳලා සංස්ථා කාලා කාලා මෙහෙට පැනලා ඉන් පස්සෙ මහින්දවාදියෝ වෙලා මෛත්‍රිපාල පරද්දන්න හැම දහංගැටයක්ම දාලා දැන් දැන් මෛත්‍රී පිටිපස්සෙන් යන අපූත පොරවල් නෙවෙයි.

අපි මේ යහපාලනෙන් ඉල්ලන්නෙ මෙල්බන් කොන්සල් කාර්යාලය අපට ආරක්ෂා කර දෙන ලෙසයි. මගේ අදහස නම් කාර්යාලයක බාහිර පෙනුමට වඩා වැදගත් වන්නේ එයින් කෙරෙන සේවයයි. ඒ නිසා ජනතාවට යන්නට එන්නට පහසු තැනක නගරයෙන් පිට අඩු වියදම් ස්ථානයකට කොන්සල් කාර්යාලය ගෙන යනවා නම් අපටත් හොඳයි. රටවත් හොඳයි. වෙනදාට වඩා ප්‍රයමනාප වීනීත සේවයකුත් අපි බලාපොරොත්තු වෙනවා. නම නරක් කරගත්තෙ නැති නිලධාරියෙක් හැටියට කොන්සල් ජනරාල් උපුල් පුෂ්පකුමාර මහත්තය ඒ ගැන හිතා බලයි කියලා අපි හිතනවා.

බලයට පොරය

මේ රටවලත් බලය ලබාගන්න කරන සටන් තුන් වන ලෝකයේ සටන් වලින් දෙවැනි වෙන්නෙ නැහැය කියලා මට හිතෙන්නෙ මේ දවස් වල යන ඇබට් ජුලියා හටන දකිනකොටයි.

ලේබර් ආණ්ඩුව කාලෙ මහජන ඡන්දයෙන් පත්වෙච්ච ජනප්‍රිය නායකයකු වුණ කෙවින් රඩ් බලයෙන් පහකරන්න ජුලියා ගිලාඩ් ගෙනිච්ච සටනින් අන්තිමේ වුණේ ලේබර් එකට ආණ්ඩු බලෙන් නැති වෙලා අන්ත දක්ෂණාංශික ටෝනි ඇබට් බලයට පත්වෙච්ච එකයි. දැන් මෙන්න ඇබට්ගෙන් බලය ගන්න ඒ විදිහේම සටනක් ලිබරල් එකේ ජුලියා බිෂොප් පටන් රගෙන

යනවා.

ටෝනි ඇබට් - මෙඩිකෙයා බද්ද උසස් අධ්‍යාපන බද්ද වගේ ජනවිරෝධී ක්‍රියාමාර්ග නිසා ජනප්‍රියත්වයෙන් පහළටම බැහැලා ඉන්න බව ඇත්තයි. මේ විදිහට ගියොත් ආණ්ඩුවට එක වාරයකින්ම ගෙදර යන්න වෙන බවත් ඇත්තයි. ඒත් බලය ලබා ගැනීම සඳහා මේ වගේ කෙටි පාරවල් සොයා යාම නම් මං ඒ තරම් කැමති දෙයක් නෙවෙයි. ටෝනි ඇබට් පරද්දන්න ඕනෙ නම් මහ ජන්දයකට ගිහින් ඒක කරමු. එතකොට මිනිස්සුන්ට කැමති නායකයෙක් විතරක් නෙවෙයි කැමති පක්ෂයක්ම බලයට පත් කරගන්න පුලුවන්නෙ. නැද්ද මං අහන්නෙ?

ප්‍රතිචාරයට ප්‍රතිචාරයක්

මං ගිය මාසෙ දහඅට වංගුවට ලිව්ව සටහනක් ගැන එක මහත්තයෙක් එවල තිබුණ අදහස් දැක්වීමක් සන්නස සංස්කාරක මහතා මට එවලා තිබුණා. ඒ අදහස් දැක්වීම ගැන සතුටුයි. ඒ වගේම ස්තුතියි. වැඩිහිටියන්ගේ අදහස් අදහස් වලට ගරු කරනවා. මටත් ඕනෙ මේ දෙවල්



ගැන සංවාදයක් ගොඩ නැගෙනවා බලන්නම තමයි.

ඒත් මේ දේ ගැනත් හිතන්න. අසභ්‍ය වචනයක් නෙවෙන අතිශය පිරිසිදු සිංහල වචනයක් දැක්කමත් ලැජ්ජා හිතෙනවා නම් ඒක

මොකක්දෝ ලෙඩක්ම තමයි.

මගේ සටහනින් මං අදහස් කළෙත් මේ අපබ්‍රංශ ලැජ්ජාව ගැන ප්‍රශ්න කරන එකම තමයි. ඉංග්‍රීසියෙන් ඕනෙම කුණුහරුපයක් ලැජ්ජා නැතුව කියන, අහන, බලන, ලියන මේ අය සිංහල භාෂාවේ පිරිසිදු වචනයක් දැක්කමත් ලැජ්ජා වෙනවා. ගල් ගැහෙනවා. තුෂ්ණීම්භූත වෙනවා. මොකද මේ? ඒකම තමයි මගේ සටහනේ මං අහන ප්‍රශ්නයත්. මට ප්‍රතිචාරයක් ලිව්ව මහත්තය කළෙත් මගේ අදහසම තහවුරු කරන සාක්කියක් දුන්න එකම තමයි.

ඉංග්‍රීසි වචන සිංහලෙන් ලියවෙන අවස්ථා තියෙනවා. ඒත් සම්මත සිංහල ශබ්දකෝෂයකින් තේරුම බලාගන්න බැරි කිසිම සිංහල වචනයක් මං මගේ සටහන් වල ලියන්නෙ නැහැ මහත්වරුනි. අනිවා ඩෙෆා.

වර්ල්ඩ් කප් ක්‍රිකට්.. අනේ හරිම ගණන්

අපි ක්‍රිකට් උන්මාදයකින් පෙළෙන ජාතියක්නෙ. ඒ නිසාම ක්‍රිකට් වර්ල්ඩ් කප් කියන්නෙ අත අරින්නම බැරි ඉවෙන්ට් එකක්. අනික් අතට ඒක අපේ ගේ දොරකඩමට ඇවිත් තියෙද්දි කොහොමද නොගිහින් ඉන්නෙ?

ඒත් ප්‍රශ්නයක්. මං වගේ පුංචි රස්සාවක් කරන පුංචියට හරි පවුලක් තඩිත්තු කරන කෙනෙක් කොහොමද ඩොලර් දෙසිය ගණන් දීලා ටිකට් එකක් අරගෙන ෆයිනල් බලන්න යන්නෙද? මට වඩා ලොකු පවුලකට ඒක සැබෑ කර ගන්නම අමාරු හීනයක් වෙනවාමයි.

හැම දේටම කෑ ගහන අපි වෙනදට ඩොලර් තිහට පනහට තිබ්බ ටිකට් එක පාරටම දෙසිය ගාණක් වෙච්ච එක ගැන හීං කෙඳිරියක් වත් නැතුවෙ නැහැනෙ. අඩුම ගානෙ ක්‍රිකට් පාලක මණ්ඩලේට ඊමේල් ව්‍යාපාරයක් වත්.

හැම දේම කරබාගෙන බාරගන්න එරක මේ රටේ ක්‍රමයක් වගේ. ලයිට් බිල් ගෑස් බිල් ඉන්ෂුවරන්ස් රෙජිස්ට්‍රේෂන් අර බිල් මේ බිල් හැම එකක්ම වැඩිවෙද්දි මේ රටේ මිනිස්සු "හ්මී" කියලා සද්දයක් පිට කරන්නෙ නැහැනෙ. අපිත් දැන් ඒ විදිහටම හැඩ ගැහිලා කියලයි මට හිතෙන්නෙ. දේසේ හැටියට බාසේ කිව්වලුනෙ.

ඒත් මේ වගේ දරාගන්න බැරි අසාධාරණ මිල ගණන් දකිනකොට නං මට හිතෙන්නෙ අර ලංකාවෙ වගේ ලිප්ටන් වට රවුමක් මෙහෙත් තිබ්බනම් හොඳයි කියලයි. අඩුම ගානෙ එතෙන්ට ගිහින් කෑ කැහුවම පාලකයන් දැන ගන්නාවා මේ වැඩේට ජනතාවගේ විරෝධයකි තියෙනවා කියන කාරණය වත්.

චූටි මල්ලි කොහොම හරි ක්‍රිකට් බලන්න යනවා. ඒත් අර ගිණි ගණන් ටිකට් දකිද්දි ඇතකි වෙනෙ වේගය නමා පාලනය කරගන්න අමාරුයි.

චූටි මල්ලි